ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
இலங்கை சமூகப் பாதுகாப்புச் சபை
Sri Lanka Social Security Board

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය/ எனது இல : 4/2/3/චක්‍රලේඛ
ඔබේ අංකය/ உமது இல :

දිනය / திகதி / Date : 2025.09.11

අභ්‍යන්තර චක්‍රලේඛ SLSSB-09/2025

ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරීන්,
සම්බන්ධීකරණ නිලධාරින්,

**අතිරේක ප්‍රතිලාභ ගෙවීම කාර්යක්ෂම කිරීම**

අතිරේක ප්‍රතිලාභ ගෙවීමට අදාළ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව, අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිලාභ ගෙවීම් චක්‍රලේඛ අංක SLSSB-03/2022 මගින් නිකුත් කර ඇති උපදෙස්වලට අමතර වශයෙනි.

ඒ අනුව **"ආරස්සාව"** පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ අතිරේක ප්‍රතිලාභ ගෙවීම කාර්යක්ෂම කිරීමේ අරමුණින් රු 50,000 /- හෝ ඊට අඩු අතිරේක ප්‍රතිලාභ ගෙවීම නිර්දේශ කිරීමේ කටයුතු 2025.09.15 දින සිට දිස්ත්‍රික් කර්යාලය වෙත පවරන අතර පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

01. A1 (B) ආදර්ශ අයදුම්පත්‍රය (ඇමුණුම 1) ප්‍රකාරව අතිරේක ප්‍රතිලාභ අයදුම්කිරීම.

I. SLSSB 3/2022 චක්‍රලේඛය අනුව සුදුසුකම් සපුරා ඇති ප්‍රතිලාභ ඉල්ලීම්වලට අදාල සාමාජිකයන්ගේ ගිණුම් දත්ත පද්ධතියෙන් පරීක්ෂා කර අදාල තොරතුරු කළමනාකරණ සහකාර විසින් ඇමුණුම 2 ආකෘතිපත්‍රයට ඇතුලත් කිරීම.

II. ඇමුණුම 2 හි සඳහන් ආකෘති පත්‍රයට කළමනාකරණ සහකාර විසින් ඇතුලත් කරන ලද තොරතුරු විභාග දෙපාර්තමේන්තුවෙහි https://www.doenets.lk/examresults වෙබ් පිටුවෙන් පරිසාදන මට්ටම සපුරා ඇතිද යන්න තහවුරු කර ඇමුණුම 2 හි සඳහන් ආකෘතිපත්‍රයට අදාල සියලු තොරතුරු සම්බන්ධීකරණ නිලධාරී විසින් නිර්දේශ කර ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී මගින් ගෙවීම් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කළ යුතුය. (සියළු ලේඛණ ඊ-මේල් මඟින් යොමු කළ යුතුය)

III. ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි විසින් එම ආකෘතිපත්‍රයෙහි නිර්දේශ කර ඇති ප්‍රතිලාභීන්ගේ තොරතුරු අහඹු ලෙස (10%) පරීක්ෂා කර එය සත්‍ය හා නිවැරදි බව සනාථ කර වැඩකරන දින දෙකක් ඇතුලත ප්‍රධාන කාර්යාලය වෙත යොමු කළ යුතුය.

IV. අදාල නිර්දේශයන් සහිත ලේඛනය පරිලෝකනය කර ඊ-මේල් (mgr.pension@ssb.gov.lk) මගින් සමාජ ආරක්ෂණ නිලධාරී (රක්ෂණ) වෙත යොමුකළ යුතුය.

පොදු දුරකතන / பொது தொலைபேசி இல. / General No. : 0112 886585 / 0112 886586
ක්ෂණික ඇමතුම් / உடனடி அழைப்பு / Hot Line : 0112 886088
වෙබ් අඩවිය / இணையத்தளம் / Website : www.ssb.gov.lk ඊ-මේල් / ஈ-மெயில் / E-mail : info@ssb.gov.lk
"සමාජ ආරක්ෂණ පියස", අංක 18 , රාජගිරිය පාර, රාජගිරිය "Samaja Arakshana Piyasa" ,No.18, Rajagiriya Road, Rajagiriya "சமாஜ ஆரக்ஸன பியச", இல.18, ராஜகிரிய வீதி, ராஜகிரிய

පහත අංක 02 යටතේ සඳහන් මාර්ගගත ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබාගැනීමට අයදුම් කර ඇති සාමාජිකයන්ගෙන් නැවත A1(B) අයදුම්පත්‍රයක් සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ.

02. මාර්ගගත ක්‍රමය යටතේ අතිරේක ප්‍රතිලාභ අයදුම් කිරීම.

I. ආරක්ෂාව පූර්ව සැලසුම් යෝජනා ක්‍රමය යටතේ අතිරේක ප්‍රතිලාභ ඉල්ලීම් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම් කිරීමට පහසුකම් සලසා ඇත.

II. මාර්ගගත ක්‍රමය ඔස්සේ (Google Form) සෘජුවම සාමාජිකයාට/ දෙමවුපියන්ට/ භාරකරුට ප්‍රතිලාභ සඳහා අයදුම් කළ හැකිය. ඒ සඳහා ප්‍රතිලාභ අයදුම් කිරීමේ සබැඳිය (Link) සාමාජිකයා වෙත ප්‍රධාන කාර්යාලය විසින් යොමුකිරීමට කටයුතු කෙරේ.

III. දිස්ත්‍රික් කාර්යල වෙත පැමිණෙන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ද මෙම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රතිලාභ අයදුම් කිරීම සඳහා පහසුකම් සැලසිය හැකිය.

IV. මාර්ගගත ක්‍රමවේදය යටතේ ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන ප්‍රතිලාභ අයදුම්පත් විස්තර අදාල දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමුකරන අතර ඉහත 1 හි සඳහන් උපදෙස් අනුව සම්බන්ධීකරණ නිලධාරී / ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී විසින් නිර්දේශ කර සමාජ ආරක්ෂණ නිලධාරී (රක්ෂණ) වෙත ඊ-මේල් (mgr.pension@ssb.gov.lk) මගින් යොමුකළ යුතුය.

එම්.කේ.බී දිසානායක
සභාපති.

*SSB A 1(B)* ඇමුණුම 1

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය**
**"ආරස්සාව" පූර්ව සැලසුම් යෝජනා ක්‍රමයේ අතිරේක ප්‍රතිලාභ ගෙවීම සඳහා**
**තොරතුරු ලබාගැනීමේ ආකෘතිපත්‍රය**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දායක අංකය | | | | | | | | | | | |
| විභාග අංකය | | | | | | | | | | | |

01. සාමාජිකත්වය ලැබූ දරුවාගේ සම්පූර්ණ නම:- ..................................................................................
02. මව/පියා/භාරකරුගේ සම්පූර්ණ නම:- ..............................................................................................
03 භාරකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය: ..................................................
04. ලිපිනය:- ........................................................................................................දුරකථන අංකය * : ...............
05. සමත්වූ විභාගය: 5 වසර ශිෂ්‍යත්වය ☐ අ.පො.ස.(සා.පෙළ) ☐ අ.පො.ස(උ.පෙළ) ☐
06. ප්‍රතිලාභ ප්‍රේෂනය කළයුතු අයගේ බැංකු ගිණුම් විස්තර (බැංකු පොතේ පැහැදිලි ඡායා පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.)
    I බැංකුවේ නම: ....................................... III ගිණුම් අංකය: ..............................
    II ශාඛාව : ......................................
07. මේ සමඟ පහත සඳහන් දෑ මීට අමුණා එවමි.
    - අ.පො.ස (උ.පෙළ) සමත්ව ප්‍රතිලාභ අයදුම් කරන විට ජාතික විශ්ව විද්‍යාලයට තෝරාගත් බව සඳහන් ලිපියේ සහතික කළ පිටපතක් (එම ලිපියේ දින සිට දින 90 ඇතුළත ප්‍රතිලාභය අයදුම් කළ යුතුය).

ඉහත කරුණු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

..........................................
දිනය: .................................... දෙමාපිය/භාරකරුගේ අත්සන

*** සැ.යු - වට්ස්ඇප් හා කෙටිපණිවිඩ මගින් තොරතුරු ලබාදිය හැකි දුරකථන අංකයක් ලබාදෙන්න.**

---

<u>**දිස්ත්‍රික් කාර්යාලය විසින් සම්පූර්ණ කළයුතුය.**</u>

08. විභාගයට පෙනී සිටි වර්ෂය:- .............................
09. දිස්ත්‍රික්කය:- ....................................................
10. අදාළ වර්ෂයේ විභාග කඩඉම් ලකුණ(ශිෂ්‍යත්ව විභාගය):- ......................... ශිෂ්‍යත්ව විභාග ලකුණු: ..............

චක්‍රලේඛන අංක SLSSB 3/2022 ප්‍රකාරව ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵලය අන්තර්ජාලය මගින් පරීක්ෂා කර ඇති බවත්/ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල ලේඛනය /අ.පො.ස.(උ.පෙළ) සමත්ව ජාතික විශ්වවිද්‍යාලයට තෝරාගත් ලිපිය ඉදිරිපත් කර ඇති බවටත්, සහතික කර නිර්දේශ කරමි.

දිනය:- ............................. ..........................................
දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරිගේ අත්සන
නිල මුද්‍රාව

ඇමුණුම - 2

## ආරස්සාව පූර්ව සැලසුම් යෝජනා ක්‍රමය
## අතිරේක ප්‍රතිලාභ ගෙවීම

| අනු අංකය | දායක අංකය | දරුවාගේ නම | විභාග අංකය | ගෙවන අය | බැංකුවේ නම * | බැංකු ශාඛාවේ නම | ගිණුම් අංකය | ප්‍රතිලාභ මුදල |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| 4 | | | | | | | | |
| 5 | | | | | | | | |

සකස් කළේ : ..............................
කළමනාකරණ සහකාර

චක්‍රලේඛන අංක SLSSB 3/2022 ප්‍රකාරව ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, ආරස්සාව යෝජනා ක්‍රමයේ දත්ත පද්ධතිය හා පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය කඩඉම් ලකුණු ලබා සමත්ව ඇති බැවින් එම ප්‍රතිඵලය විභාග දෙපාර්තමේන්තුවෙහි වෙබ් පිටුව වන https://www.doenets.lk/examresults මගින් පරීක්ෂා කර අදාල ගෙවීම් කටයුතු සඳහා මාගේ නිර්දේශය ලබාදෙමි.

.................................
දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිළධාරී

උක්ත ලේඛනයෙහි ඇති අංක ............................................................ අහඹු ලෙස පරීක්ෂා කර එය සත්‍ය හා නිවැරදි බව සනාථ කරමි.

............................
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිළධාරී

* PB - මහජන බැංකුව
BOC - ලංකා බැංකුව
NSB - ජාතික ඉතිරිකිරීමේ බැංකුව
HNB - හැටන් නැෂනල් බැංකුව
SB - සම්පත් බැංකුව
RDB -ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
COM BANK - කොමර්ෂල් බැංකුව